පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 906 / 2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திக / Date — 29/05/2024 පැය 1530

# මාධ්‍ය නිවේදනය

## මාරක රිය අනතුරක් - පැල්මඩුල්ල පොලිස් වසම.

2024.05.29 වන දින උදෑසන කාලයේදී පැල්මඩුල්ල පොලිස් වසමේ රිල්හේන ප්‍රදේශයේද ඇඹිලිපිටිය සිට කොළඹ දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් රත්නපුර සිට පැල්මඩුල්ල දෙසට ධාවනය වූ ත්‍රී රෝද රථයක ගැටී බස් රථය මාර්ගයෙන් ඉවතට පැන අඩි 15ක පමණ ප්‍රපාතයකට පෙරළී අනතුරක් සිදුව ඇත.

අනතුරින්බස් රථයේ ගමන් ගත් මගීන් 10 දෙනෙකු හා ත්‍රී රෝද රථයේ රියදුරු ඇතුලු මගීන් තිදෙනෙකු තුවාල ලබා ප්‍රතිකාර සඳහා පැල්මඩුල්ල, කහවත්ත හා රත්නපුර රෝහල් වෙත ඇතුලත් කර ඇත. එහිදී අනතුරට පත් ත්‍රී රෝද රථයේ ගමන්ගත් කාන්තාවක් ප්‍රතිකාර ලබමින් සිටියදී මිය ගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 26ක් වූ පස්සර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය රත්නපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පැල්මඩුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**